---

මුත්තූර් ප්‍රදේශිය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය .

---

1 මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2011 ජුලි 27 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයා ගේ වාර්තාව 2012 දෙසැම්බර් 31 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

---

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ,මුත්තූර් ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මුත්තූර් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර තිබුණු වටිනාකම රු.48,588 ක් වූ ගබඩා විෂයයන් භෞතිකව සමික්ෂණය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) විවිධ පාර්ශවයන් විසින් පරිත්‍යාග කරන ලද වාහන, ට්‍රැක්ටර්, ටේලර්, ජල පොම්ප, රෝද දෙකේ ට්‍රැක්ටර්, ලී බඩු සහ කාර්යාල උපකරණ වල වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 දෙසැම්බර් 31 දින වන විටත් විගණන විමසුම් 16 කට පිළිතුරු සපයා නොතිබුණි. විගණන විමසුම් වලට අදාලව ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.2,096,456 ක් විය.

(ආ) විගණනය සඳහා තොරතුරු නොසැපයීම් .

විගණනය සඳහා අවශ්‍යය තොරතුරු නොසැපයීම නිසා එකතුව රු.45,029,428 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරිමට නොහැකි විය .

2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,128,131 ක් වූ අතර එයට අනුරූපිව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,887,355 ක් විය .

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිග ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිග ආදායම පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2011 ඇස්තමේන්තුගත | 2011 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු . |
| i . | වරිපනම් සහ බදු | 4,434 | 509 | 3,925 |
| ii . | කල්බදු | 10,358 | 3,098 | 7,260 |
| iii . | බලපත්‍ර ගාස්තු | - | - | - |
| iv . | වෙනත් ආදායම් | 9 | 1 | 8 |
| | | 14,801 | 3,608 | 11,193 |

2.2.2 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

(අ) 2011 දෙසැම්බර් 31 දිනට මහේස්ත්‍රාත් උසාවි වෙතින් සභාව වෙත ලැබිය යුතු උසාවි දඩ අයකර ගෙන නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.